53

<u>වගා ආධාර චක්‍රලේඛ අංක: 28</u>

මගේ අංකය: සං/ව.ආ/ප්‍රති IV
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.
1990.04.24 දින.

සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ
ස්ථානභාර නිලධාරීන් වෙත.

නැවත වගා 'බී' ආධාර ක්‍රමය යටතේ උදුරා
<u>දැමීමට නියමිත ඉඩම් වෙනුවෙන් කටයුතු කිරීම</u>

තේ නැවත වගා 'බී' ආධාර ක්‍රමය යටතේ තේ වගා කිරීම සඳහා අවසර දී ඇති බිම් ප්‍රමාණයකට සමාන බිම් ප්‍රමාණයක් තේ වගාවෙන් ඉවත් කළ යුතුවූ අතර එහි තේ කොමසාරිස් කාර්යාලයීය ලියාපදිංචිය අවලංගු කිරීමද කරනු ලැබේ. තේ අලුතින් වගා කිරීමේ ආධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ක්‍රියාත්මකවූ මෙම ක්‍රමයේ පරමාර්ථය වූයේ දිවයිනේ තේ වගා බිම් ප්‍රමාණය වැඩි නොවන සේ පාලනය කිරීමයි.

තේ අලුතින් වගා කිරීමේ ආධාර ක්‍රමය මුලින්ම සීමිත පදනමකින් ආරම්භ කොට පසුව තේ වගාවට සුදුසු සියළුම ඉඩම් සඳහා අවසර දීමට හැකි වන පරිදි දැනට පුළුල් කර ඇත. ඒ අනුව තේ නැවත වගා 'බී' ක්‍රමයද අහෝසි කර තිබේ.

එසේ වුවද තේ නැවත වගා 'බී' ක්‍රමය යටතේ උදුරා ඉවත් කිරීමට නියමිත ඇතැම් තේ ඉඩම්වල තවදුරටත් තේ වගාව පවත්වාගෙන යන බවත්, ඇතැම්විට ලියාපදිංචිය පවා අවලංගු නොකර ඇති බවද වාර්තාවී තිබේ. මෙවැනි ඉඩම්වල යලිත් තේ වගා කිරීම සඳහා ඉල්ලීම් ලැබී ඇති අතර, ඒ සඳහා කලක් අලුත් වගා ආධාර ක්‍රමය යටතේ අවසරදී පසුව 1989.08.20 දින සිට කවර හෝ ආධාර ක්‍රමයක් යටතේවත් අවසර නොදෙන ලෙස දන්වා ඇත.

දැනට නැවත වගාව සහ පාළු සැපයීමේ ආධාර ක්‍රම සඳහා අධිකාරිය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියට අනුව තේ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචිවී ඇති තේ ඉඩම්වලට පමණක් එකී ආධාර ක්‍රම දෙක සීමා නොකොට එසේ ලියාපදිංචි නොවූ තේ ඉඩම් සඳහාද අනෙකුත් සුදුසුකම් සම්පූර්ණවී තිබේ නම් අවසර දෙනු ලැබේ. අනෙකුත් සුදුසුකම් වශයෙන් ඉඩම තේ ඉඩමක් බවට තහවුරු වීම, තේ වගාවට ඉඩම තවදුරටත් යෝග්‍ය වීම, ඉඩමේ අයිතිය, පූර්ව සහනාධාර ගෙවීම් වැනි කරුණු සළකා බලනු ලැබේ.

නැවත වගා 'බී' ආධාර ක්‍රමය සඳහා පසුබිම් වූ පාලන ප්‍රතිපත්තිය දැනට අහෝසිවී ඇති හෙයින්ද, එබඳු ඉඩම් නැවත තේ වගාව සඳහා ඉදිරිපත් වන අවස්ථාවල හඳුනා ගැනීමට ඇති දුෂ්කරතාවයද සළකා 'බී' අවසර පත්‍ර දරණ ඉඩම් වෙනුවෙන් තේ වගාවෙන් ඉවත් කළ යුතු ඉඩම්වලද තේ වගා කිරීම සඳහා අවසර ඉල්ලීමේදී ඉහත සඳහන් ප්‍රතිපත්තියම අනුගමනය කරමින් මූලික පරීක්ෂණයේදී / තේ ප්‍රථමත් ලෙස සනාථ කෙරෙන ඉඩම් තේ නැවත වගා ක්‍රමය යටතේද එසේ සනාථ කළ නොහැකි ඉඩම්(තේ වගාවක් තිබූ බවට සාධක දක්නට නොමැතිවීම වෙනත් වගාවක් කර තිබීම වැනි) අලුත් වගා ආධාර ක්‍රමය යටතේද අවසර දීමට කටයුතු කළ යුතුය.

තවද මෙම කරුණ පිළිබඳව 1986.08.20 දිනැති චක්‍රලේඛ ලිපි අංක 138 හි 04 වන ඡේදයේ සඳහන් උපදෙස් මෙම චක්‍රලේඛය පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ.

(ආචාර්ය සරත් බී. මානවත්ත)
සභාපති.

පිටපත්: 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(සංවර්ධන)
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ව්‍යාප්ති)
3. අභ්‍යන්තර විගණක
4. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි
5. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්

රුප/